# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2385/14 - 2024 මැයි මස 21 වැනි අඟහරුවාදා - 2024.05.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය) වන පඩිපාලක සභා ආඥාපනතේ 33(1) (අ) වැනි වගන්තිය යටතේ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යවරයා විසින් පනවනු ලැබ, 2024 අප්‍රේල් මස 25 වැනි දින අංක 2381/35 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආඥාවෙන් කම්කරු කොමසාරිස්වරයා වෙත පවරනු ලැබූ බලය ප්‍රකාරව ඉහත කී ආඥාපනතේ 33(2) වගන්තිය යටතේ කම්කරු කොමසාරිස්වරයා විසින් තේ වැවීමේ සහ සැදීමේ කර්මාන්තයෙහි නියුක්ත සේවකයන් සම්බන්ධයෙන්, පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන දෛනික අවම ගෙවීම් ප්‍රමාණය පිළිබඳව ගන්නා ලද තීරණය ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමන් විසින් අනුමත කරන ලද බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 33(3) වගන්තිය සමග කියවෙන 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2024 මැයි 21 දින සිට වලංගු විය යුතු ය.

**ආර්. පී. ඒ. විමලවීර,**
ලේකම්,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය.

2024 මැයි මස 21 වැනි දින,
කොළඹ 05,
''මෙහෙවර පියෙස'',
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.


1A - G 41972— 09 (2024/05)



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය*

තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1945 ජූලි මස 31 වැනි දින අංක 9441 දරන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, වරින් වර වෙනස් කරන ලද්දාවූ ද, අවසන් වරට 2021 මාර්තු 05 දින අංක 2217/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දාවූ එකී II වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතුය.

*II වන කොටස*

**තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තයේ සේවයේ නියුතු කම්කරුවන් සඳහා ගෙවීම් කිරීමේ ක්‍රමවේදය**

| *අනු. අංකය* | *විස්තරය* | *ගෙවීම* |
|---|---|---|
| I. | දෛනික වේතනය<br>(මෙම ප්‍රමාණය තුළ දෛනික අයවැය සහන දීමනාව ද ඇතුළත් වන අතර සේ. අ. අ. සහ සේ. නි. භා. අ. ගෙවීම සඳහා මෙම ප්‍රමාණය අදාළ කරගත යුතු වේ.) | රු. 1,350.00 |
| II. | දෛනික විශේෂ දීමනාව | රු. 350.00 |
| III. | දෛනික සම්පූර්ණ ගෙවීම | රු. 1,700.00 |
| IV. | වැඩිපුර ගෙනෙන කිලෝග්‍රෑම් 01 ක් සඳහා ගෙවීම | රු. 80.00 |

EOG 05 - 0163/1

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය) වන පඩිපාලක සභා ආඥාපනතේ 33(1) (අ) වැනි වගන්තිය යටතේ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යවරයා විසින් පනවනු ලැබ, 2024 අප්‍රේල් මස 25 වැනි දින අංක 2381/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආඥාවෙන් කම්කරු කොමසාරිස්වරයා වෙත පවරනු ලැබූ බලය ප්‍රකාරව ඉහත කී ආඥාපනතේ 33(2) වගන්තිය යටතේ කම්කරු කොමසාරිස්වරයා විසින් රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තයෙහි නියුක්ත සේවකයන් සම්බන්ධයෙන්, පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන දෛනික අවම ගෙවීම් ප්‍රමාණය පිළිබඳව ගන්නා ලද තීරණය ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමන් විසින් අනුමත කරන ලද බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 33(3) වගන්තිය සමඟ කියවෙන 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2024 මැයි 21 දින සිට වලංගු විය යුතු ය.

ආර්. පී. ඒ. විමලවීර,
ලේකම්,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය.

2024 මැයි මස 21 වැනි දින,
කොළඹ 05,
''මෙහෙවර පියෙස'',
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1949 නොවැම්බර් මස 25 වැනි දින අංක 10047 දරන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, වරින් වර වෙනස් කරන ලද්දාවූ ද, අවසන් වරට 2021 මාර්තු 05 දින අංක 2217/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දාවූ එකී II වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතුය.

*II වන කොටස*

**රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තයේ සේවයේ නියුතු කම්කරුවන් සඳහා ගෙවීම් කිරීමේ ක්‍රමවේදය**

| *අනු. අංකය* | *විස්තරය* | *ගෙවීම* |
|---|---|---|
| I. | දෛනික වේතනය<br>(මෙම ප්‍රමාණය තුළ දෛනික අයවැය සහන දීමනාව ද ඇතුළත් වන අතර සේ. අ. අ. සහ සේ. නි. භා. අ. ගෙවීම සඳහා මෙම ප්‍රමාණය අදාළ කරගත යුතු වේ.) | රු. 1,350.00 |
| II. | දෛනික විශේෂ දීමනාව | රු. 350.00 |
| III. | දෛනික සම්පූර්ණ ගෙවීම | රු. 1,700.00 |
| IV. | වැඩිපුර ගෙනෙන කිලෝග්‍රෑම් 01 ක් සඳහා ගෙවීම | රු. 80.00 |

EOG 05 - 0163/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.